" විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "

# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE


204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone - 011 - 2093000


ISO/IEC: 17021
QMS-001-01

මගේ අංකය / எனது இலக்கம் / My No. CSWP/ADM/18-38/FI/05(A)
ඔබේ අංකය / உமது இலக்கம் / Your No.
දිනය / திகதி / Date 2021.11.26

පාලන චක්‍රලේඛ : 04/2021

ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාරවර කාර්යාලය(බ.ප.),
සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය (බ.ප.),
ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.),
සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්, (බ.ප.),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/පිරිස් හා පුහුණු/මුල්‍ය/සැලසුම්/ඉංජිනේරු),
පළාත් ආදායම් කොමසාරිස්,ආදායම් දෙපාර්තමේන්තුව(බ.ප.),
අධ්‍යක්ෂ,අභ්‍යන්තර විගණන ඒකකය (බ.ප.),
ප්‍රධාන නීති නිලධාරි,නීති ඒකකය (බ.ප.),
ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්/පරිපාලන නිලධාරී,

**අනුමත බඳවා ගැනීමේ පටිපාටි සහ සේවා ව්‍යවස්ථා වල සඳහන් "පූර්වාසන්න වසර පහක (05) සතුටුදායක සේවා කාලය " සම්බන්ධව වන විධිවිධානයන් සංශෝධනය කිරීම**

යථෝක්ත කාරණයන් සම්බන්ධයෙන් 2020.01.01 දින නිකුත් කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2020 හා 01/2020 (II) පදනම් කරගනිමින් මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

01. අනුමත බඳවා ගැනීමේ පටිපාටි හා සේවා ව්‍යවස්ථාවන් වල ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්යයන් සඳහා සහ සීමිත හා කුසලතා (සේවා පළපුරුද්ද) ධාරාවන් යටතේ බඳවා ගැනීමේ කාර්යයන් සඳහා සුදුසුකමක් ලෙස සලකා බලනු ලබන "පූර්වාසන්න වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම " යන අවශ්‍යතාවය වෙනුවට "පාලන චක්‍රලේඛ අංක 04/2021 හි සඳහන් විධි විධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය" යන අවශ්‍යතාවය ඇතුලත් කරමින් එම බඳවා ගැනීමේ පටිපාටි හා සේවා ව්‍යවස්ථා සංශෝධනය කරනු ලැබේ.

02. ආයතන සංග්‍රහයේ XLVIII වන පරිච්ඡේදයේ වැරදි පිළිබඳ පළමුවන උප ලේඛනය යටතේ හෝ බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ විනය කාර්යය පරිපාටි රීති යටතේ 31.3 උප වගන්තියේ දක්වා ඇති වරදක් සම්බන්ධයෙන් දඬුවමක් ලබා ඇති නිලධරයෙකු එම වරද සිදු කළ දිනයේ සිට වසර පහක (05) කාල සීමාවක්ද, ආයතන සංග්‍රහයේ XLVIII වන පරිච්ඡේදයේ වැරදි පිළිබඳ දෙවන උපලේඛනය යටතේ හෝ බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ විනය කාර්යය පරිපාටි රීති යටතේ 31.2 උප වගන්තියේ දක්වා ඇති වරදක් සම්බන්ධයෙන් දඬුවමක් ලබා ඇති නිලධරයෙකු එම වරද සිදු කළ දිනයේ සිට වසර දෙකක (02) කාල සීමාවක්ද, ආයතන සංග්‍රහයේ XLVIII වන පරිච්ඡේදයේ 25.2 වගන්තිය යටතේ හෝ බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ විනය කාර්යය පරිපාටි රීති යටතේ 32.2 උප

වගන්තියේ දක්වා ඇති ලඝු විනය ක්‍රියා පටිපාටිය යටතේ විනය දඬුවමක් ලබා ඇති නිලධරයෙකු එම වරද සිදු කළ දිනයේ සිට වසරක කාල සීමාවක්ද ගතවනතුරු බඳවා ගැනීමේ පටිපාටි හා සේවා ව්‍යවස්ථාවන් අනුව සීමිත හා කුසලතා (සේවා පළපුරුද්ද) ධාරාවන් යටතේ බඳවා ගැනීමට හෝ පුරප්පාඩු සංඛ්‍යාව මත ලබා දෙනු ලබන ශ්‍රේණි උසස්වීමකට හෝ නුසුදුසු නිලධාරියකු ලෙස සැලකිය යුතුය.

03. සීමිත හා කුසලතා (සේවා පළපුරුද්ද) ධාරාවන් යටතේ සිදු කරනු ලබන බඳවා ගැනීමකදී හෝ පුරප්පාඩු සංඛ්‍යාව මත ලබා දෙනු ලබන ශ්‍රේණි උසස්වීමකදී හෝ අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් දිනයකට නිලධාරියෙකුගේ සුදුසුකම් පරීක්ෂා කර ඉදිරි දිනයක සිට බලාත්මක වන පරිදි බඳවාගැනීම හෝ උසස්වීම ලබාදෙනු ලබන අවස්ථාවකදී, නිලධාරියා සුදුසුකම් පරීක්ෂා කරනු ලබන දිනයේ සිට බඳවාගැනීම හෝ උසස්වීම ක්‍රියාත්මක වන දිනය දක්වා කාලය තුලදී විනයානුකූලව දඬුවමක් ලබා ඇත්නම් ඉහත 02හි සඳහන් විධිවිධානයන් එම බඳවාගැනීම හෝ උසස්වීම ක්‍රියාත්මක වන දිනයට අදාල කර ගැනීමට සහ එම කාල සීමාව තුල සිදු කල වරදක් සම්බන්ධයෙන් චෝදනා පත්‍රයක් නිකුත් කර ඇත්නම් ආයතන සංග්‍රහයේ XLVIII වන පරිච්ඡේදයේ 14.12 හි සඳහන් විධිවිධාන හෝ බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ විනය කාර්යය පරිපාටි රීති යටතේ 21.12 උප වගන්තියේ විධිවිධාන අදාල කර ගැනීමට කටයුතු කල යුතුය.

04. සේවය අතහැර යාමේ නිවේදනයක් සම්බන්ධව ඉදිරිපත් කරන ලද අභියාචනය සලකා නැවත සේවයේ පිහිටුවා ඇති නිලධාරියෙකු නැවත සේවයේ පිහිටුවනු ලැබූ දිනයේ සිට වසර 02ක කාලයක් දක්වා අනුමත බඳවා ගැනීමේ පටිපාටිය හෝ සේවා ව්‍යවස්ථාව අනුව සීමිත හා කුසලතා (සේවා පළපුරුද්ද) ධාරාව යටතේ බඳවා ගැනීමට හෝ ශ්‍රේණි උසස්වීමකට නුසුදුසු නිලධාරියෙකු ලෙස සැලකිය යුතුය.

05. තවද,නිලධාරියෙකුගේ සතුටුදායක සේවා කාලය ගණනය කරනු ලබන සියලුම අවස්ථාවන්වලදී බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්යය පරිපාටි රීති 172 (ii) අනුව සතුටුදායක සේවා කාලය ගණනය කිරීමට කටයුතු කල යුතු බව බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබ ඇති බව වැඩිදුරටත් දන්වමි.

06. මෙම චක්‍රලේඛයේ සඳහන් විධිවිධානයන් 2020.01.01 දිනයේ සිට ක්‍රියාත්මක වේ.

ජේ.එම්.සී.ජයන්ති විජේතුංග,
ප්‍රධාන ලේකම්,
බස්නාහිර පළාත.